## දියසායම්



තුනී වර්ණ මාධ්‍යයකි. විනිවිද මාධ්‍යයක් ලෙස ද හඳුන්වයි. මේ මාධ්‍යයෙන් නිම කරන සිත්තමක ඇති ස්වභාවය අන් කවර මාධ්‍යයකින් හෝ ලබාගත නොහැකි තරම්ය. වරදකට සමාවක් නොමැති මාධ්‍යයක් ලෙස ද කලාකරුවන් අතර ප්‍රකටය. ඊට අනුව බලන කල නිවැරදි ලෙස භාවිත කිරීමට ඉතා අපහසු මාධ්‍යයකි. එහෙත් චිත්‍ර කලාවෙන් දිගු ගමනක් යැමට අපේක්ෂා කරන්නේ නම් පුහුණු වීම් කාලයේ අනිවාර්යෙන් ම දියසායම් මාධ්‍යය භාවිත තර තිබීම වැදගත් ය.

ජලයඋරාගැනීමේ හැකියාව වැඩි කඩදාසි වර්ග මත සිතුවම් කළ යුතුය. කෙන්ට් කඩදිසි සාමාන්‍යයන් භාවිත කෙරේ. එහෙත් මූලික පුහුණුවීම් සඳහා බ්‍රිස්ටල් බෝඩ් වල රළු නිමාව සහිත පැත්ත ද උචිත වේ.

